OL/2015/12/S-I, II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**12 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

**ශෛවනෙරි I, II**
சைவநெறி I, II
Saivaneri I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

## ශෛවනෙරි I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ** (X) **ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ඕනෑම වැඩ කටයුත්තක දී මුලින් ම වන්දනා කරනු ලබන දෙවියන්,
   (1) මුරුගන් ය. (2) පිල්ලෙයාර් ය. (3) අයියනාර් ය. (4) වීරපත්තිරර් ය.

2. ශ්‍රී ලංකාවේ බිහි වූ දේවාල මහිමය කියාපාන 'තල පුරාණම්',
   (1) ශිවරාත්‍රී පුරාණම් ය. (2) ඒකාදසි පුරාණම් ය. (3) තිරුකරසයි පුරාණම් ය. (4) කන්ද පුරාණම් ය.

3. කේදාර ගෞරි උපවාසය කරනු ලබන්නේ,
   (1) පංකුනි මාසයේ උත්තර නට්සත්තිරම් සමග යෙදෙන පොහොය දිනයේ දී ය.
   (2) පුරට්ටාදී මාසයේ සුක්කිලපක්ෂ අට්ටමි සිට ක්‍රිෂ්ණපක්ෂ සදූර්තසි දක්වා වන දින විසිඑකේ දී ය.
   (3) කාර්තිගයි මාසයේ අවපක්ෂ පිරදමයි සිට මාර්ගලි මාසයේ පූරපක්ෂ ශෂ්ටි දක්වා වූ දින විසිඑකේ දී ය.
   (4) අයිපසි මාසයේ දීපාවලි අමාවකට පසුව යෙදෙන පූරපක්ෂයේ පිරදමයි සිට ශෂ්ටි දක්වා වූ දින හයේ දී ය.

4. 'වාළි තිරුනාවලූර් වන්ට්‍රොණ්ඩර් පදම් පෝට්ට්‍රි' හි සඳහන් නායනාර්තුමා,
   (1) තිරුනාවුක්කරසර් ය. (2) සුන්දරමූර්ති සුවාමිහල් ය.
   (3) මාණික්කවාසග සුවාමිහල් ය. (4) තිරුමූල දේවර් ය.

5. තක්කන්ගේ දියණිය ලෙස තාට්සායිනි උපන් දවස,
   (1) පංගුනි තිංගල් ය. (2) මාසි මගම් ය. (3) පංගුනි උත්තරම් ය. (4) තෛපූසම් ය.

6. අරුණන්දි සිවාචාරියර් විසින් රචනා කරන ලද ග්‍රන්ථය
   (1) උන්මයි විලක්කම් ය. (2) තිරුවරුට් පයන් ය. (3) සිවඥාන සිත්තියාර් ය. (4) සිවඥාන පෝදම් ය.

7. සිතිවිල්ලකින් පමණක් වුව ද විමුක්තිය ලබා දෙන ශිව දේවාලය කුමක් ද?
   (1) සිදම්බරම් (2) කාසි (3) තිරුවාරූර් (4) තිරුවන්නාමලෛ

8. "සුත්තාත්තුවිද ශෛව සිද්ධාන්තය" නම් දාර්ශනික සිතිවිල්ල මුලින් ම ඉදිරිපත් කළේ,
   (1) අච්චුද කලප්පාලර් ය. (2) මෙයිකණ්ඩ දේවර් ය.
   (3) අරුණන්දි සිවාචාරියර් ය. (4) මරෛඥාන සම්බන්දර් ය.

9. දෙවියන් වාසය කරන දේවාල පිරිසිදුව තිබිය යුතු යයි සිතා, යන යන ස්ථානවල දේව සේවය කළ අයගෙන් මූලික ස්ථානය ලබන්නේ කවුරුන් ද?
   (1) මෙයිපොරුල් නායනාර් (2) සාක්කිය නායනාර්
   (3) තිරුනාවුක්කරසු නායනාර් (4) කන්නප්ප නායනාර්

10. යෝහර් සුවාමිහල්ගේ ඇදුරුතුමා,
   (1) නවනාද සිත්තර් ය. (2) සෙල්ලප්පා සුවාමිහල් ය.
   (3) සිත්තානයිකුට්ටි සුවාමිහල් ය. (4) පෙරියානයිකුට්ටි සුවාමිහල් ය.

[දෙවැනි පිටුව බලන්න

Department of Examinations, Sri Lanka

11. "එළවළු කෑම සිතට සතුටකි" යයි දේශනා කළේ,
(1) කල්යාණගිරියාර් ය.
(2) ශ්‍රීලශ්‍රී ආරුමුගනාවලර් ය.
(3) මුත්තුලිංග සුවාමිහල් ය.
(4) සිත්තානයිකුට්ටි සුවාමිහල් ය.

12. "සොල්ලිරන්දු නින්ඩ්‍ර තොන්මයි" යනුවෙන් මානික්කවාසගර් පැවසුයේ,
(1) ශිව දෙවියන්ගේ විශේෂ ගුණාංගයක් වන සොරූබ ලක්කණම් ය.
(2) ශිව දෙවියන්ගේ පොදු ගුණාංගයක් වන තඩත්ත ලක්කණම් ය.
(3) ආණව මලම් හි ගුණය ය.
(4) ආත්මය සර්වකාලීන බව ය.

13. ශිව දෙවියන්ගේ 'සකල තිරුමේනි' මොනවා ද?
(1) ශිවම්, ශක්ති, නාදම්, වින්දු
(2) වාක්කු, වායු, පාණි, පාදම්
(3) බ්‍රහ්ම, විෂ්ණු, රුද්‍රන්, මහේෂ්වරන්
(4) නාදම්, වින්දු, ඊසුරම්, සුත්තවිත්තයි

14. ශෛව නාට්පාදම්වල සන්ඩේස්වරර් විමුක්තිය ලැබූ මාර්ගය,
(1) සරියයි ය.
(2) කිරියයි ය.
(3) යෝගම් ය.
(4) ඥානම් ය.

15. කාලම්, නියදි, කලයි, විත්තයි, අරාගම්, පුරුඩන්, මූලපිරකිරුදි යනු,
(1) ශිව දර්ශනය වේ.
(2) විද්‍යා දර්ශනය වේ.
(3) කන්මේන්ද්‍රියංගල් වේ.
(4) තන්මාත්තිරයිහල් වේ.

16. ආත්ම ප්‍රාරත්ත ක්‍රියාඵලය භුක්ති විඳ අවසන් වූ පසුව එම ආත්ම විමුක්තිය ලැබීම පිණිස කරනු ලබන්නේ,
(1) විශේෂ තීට්සයි ය.
(2) අසත්තියෝ නිර්වාණ තීට්සයි ය.
(3) ආචාර්ය අභිෂේගම් ය.
(4) අංග තීට්සයි ය.

17. විජය ලංකාවට පැමිණි අවස්ථාවේ ලංකාවේ දිසා හතරෙහි ම ශිව දේවාල පහක් පිහිටා තිබූ බව පවසන ග්‍රන්ථය,
(1) මහාවංශය ය.
(2) දීපවංශය ය.
(3) චූලවංශය ය.
(4) යාල්පාන වයිබවමාලෙ ය.

18. "දීපාවලී දිනයේ උදය වරුවේ නිවෙස්වලට පිටින් පහන් දල්වා තැබීමෙන් යම තෘප්තිමත් වේ' යනුවෙන් පවසන පුරාණම් වන්නේ,
(1) ගරුඩ පුරාණම් ය.
(2) පද්ම පුරාණම් ය.
(3) පවිශ්යෝත්තර පුරාණම් ය.
(4) විෂ්ණු පුරාණම් ය

19. යාපනයේ ශෛව පරිපාලන සභාව පිහිටුවනු ලැබූ ස්ථානය කුමක් ද?
(1) වන්නාර්පන්නයි
(2) නල්ලූර්
(3) තිරුනෙල්වේලි
(4) කන්දර්මඩම්

20. ශිව දෙවියන්ට 'සෙම්මේනියෙම්මාන්' යනුවෙන් ගායනා කළේ,
(1) තිරුඥානසම්බන්දමූර්ති නායනාර් ය.
(2) තිරුමූලදේව නායනාර් ය.
(3) කාරයිකාලම්මයාර් ය.
(4) තිරුනාවුක්කරසු නායනාර් ය.

21. ක්‍රි.ව. දෙවන සියවසේ මාදෝට්ටම් සමඟ වාණිජ සබඳකම් පැවැත්වූයේ,
(1) පෘතුගීසීන්, ඉන්දියානුවන් සහ ඇමෙරිකානුවන් ය.
(2) රෝමවරුන්, පර්සිවරුන් සහ අරාබිවරුන් ය.
(3) ජපනුන්, ප්‍රංශවරුන් සහ ඉන්දියානුවන් ය.
(4) යුරෝපීයයන්, ඉතාලිවරුන් සහ ජර්මානුවන් ය.

22. ශ්‍රී ලංකාවේ මුළුමනින් ම කළුගලින් නිර්මාණය කරන ලද එකම දේවාලය,
(1) කොළඹ පොන්නම්බලවානේශ්වරම් ය.
(2) තිරුකෝනේශ්වරම් ය.
(3) තිරුකේදීශ්වරම් ය.
(4) මාමාංග පිල්ලෛයාර් දේවාලය ය.

23. කන්නගි වන්දනාව කාරයිතිවුවලට පැමිණියේ කිනම් ස්ථානයේ සිට ද?
(1) කල්මුණේ
(2) යාපනය
(3) ත්‍රිකුණාමලය
(4) වීරමුනෛ

24. අරුණන්දි සිවාචාරියර්ගේ ශිෂ්‍යයකු වන්නේ,
(1) මෙයිකණ්ඩ දේවර් ය.
(2) උමාපති සිවාචාරියර් ය.
(3) මරෛඥාන සම්බන්දර් ය.
(4) අච්චුද කලප්පාලර් ය.

25. අප උදැසන නින්දෙන් අවදි වීමෙන් පසු පළමුවෙන් ම කළ යුත්තේ,
(1) සූර්ය නමස්කාරය කිරීමයි.
(2) නිවස අතුගා පිරිසිදු කිරීමයි.
(3) 'ශිව, ශිව' යනුවෙන් උච්චාරණය කිරීමයි.
(4) දියනෑමයි.

[තුන්වැනි පිටුව බලන්න

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

26. ශෛව භක්තිකයින් ළදරුවකුට හිස කෙස් කැපීම, ආහාර කැවීම යනාදී චාරිත්‍ර දේවාලවලින් සිදු කිරීම,
(1) වර්තමානයට සුදුසු නැත.
(2) ගැහැනු දරුවන්ට පමණක් කළ යුතු ය.
(3) ශෛව භක්තිකයින් සියලු දෙනා ම කළ යුතු ය.
(4) පිරිමි දරුවන්ට පමණක් කළ යුතු ය.

27. ඇදුරු වන්දනාවෙන් විමුක්තිය ලැබූ අයගේ නම් පමණක් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) තිරුමූලර්, කුලච්චිරයාර්, අප්පූදියඩිහල්
(2) සේරමාන් පෙරුමාල්, පූසලාර්, සාක්කිය නායනාර්
(3) ඉයට්පගයාර්, තිරුනීලකණ්ඩර්, සිරුත්තොණ්ඩර්
(4) ඉලයාන්කුඩිමාරනාර්, පූසලාර්, තිරුමූලර්

28. මූලස්ථානයේ සිටින දෙවියන් දකුණු දිසාව බලා සිටින සේ පිහිටා ඇති මුරුගන් දේවාලය,
(1) නල්ලූර් කන්දසාමි දේවාලයයි.
(2) මණ්ඩූර් මුරුගන් දේවාලයයි.
(3) සෙල්වසන්නිදි මුරුගන් දේවාලයයි.
(4) මාවිට්ටපුරම් කන්දන් දේවාලයයි.

29. "පොයිතීර් ඔලුක්ක නෙරී නින්ඩ්‍රාර් නීඩු වාල්වාර්" යනුවෙන් පැවසුවේ,
(1) ඖවෙයාර් ය.
(2) තිරුඥානසම්බන්දර් ය.
(3) තිරුවල්ලුවර් ය.
(4) මාණික්කවාසහර් ය.

30. ශෛව භක්තිකයින් ශුද්ධ වූ ස්ථානවලට වන්දනාවේ යාම,
(1) විනෝදාත්මක අරමුණු සහිත වූවකි.
(2) සිතට සතුට ගෙන දෙන දෙයකි.
(3) කාලය නාස්ති කිරීමේ ක්‍රියාවකි.
(4) විශේෂිත හා ආධ්‍යාත්මික ප්‍රයෝජන ඇති දෙයකි.

31. ශෛව භක්තිකයින් ආහාර අනුභව කිරීමට පෙර ගායනා කළ යුතු තේවාරම් කුමක් ද?
(1) "නිලයිපෙරුමා රෙන්නුදියේල්... "
(2) "කාදලාගි කසින්දු කන්නීර් මල්ගි..."
(3) "අන්නම් පාලික්කුම් තිල්ලයිච්චි රම්බලම්... "
(4) "සොටඃනයි වේදියන්..."

32. තිරුමාලිගයි දේවර් සිට සේදිරායර් දක්වා වූ භක්තිකයින් නව දෙනා ගැයූ ගීත ඇතුළත් ව ඇත්තේ,
(1) තිරුවිසයිපාවල ය.
(2) තිරුපල්ලාන්ඩුවල ය.
(3) එකළොස්වන තිරුමුරයිවල ය.
(4) අටවන තිරුමුරයිවල ය.

33. 'තෙන්නවන් බ්‍රමරායන්' යන විරුද නාමය ලැබ සිටියේ කවුරුන් ද?
(1) තිරුනාවුක්කරසු නායනාර්
(2) සුන්දරමූර්ති නායනාර්
(3) මානික්කවාසග සුවාමිහල්
(4) තිරුඥානසම්බන්ද මූර්ති නායනාර්

34. දේවාල ගස (තල විරුට්ශම්) ලෙස ඇහැළ (කොන්ඩ්‍රයි) ගස තිබෙන දේවාලය,
(1) ඔඩ්ඩුසුඩ්ඩාන් තාන්තෝන්ඩ්‍රිශ්වරම් දේවාලයයි.
(2) කොක්කඩිචෝලයි තාන්තෝන්ඩ්‍රිශ්වරම් දේවාලයයි.
(3) පරාලයි විනායගර් දේවාලය යි.
(4) නයිනතිවු නාගපූෂණි අම්මන් දේවාලයයි.

35. කන්නගි වන්දනාවේ දී ගයනු ලබන ග්‍රන්ථ ඇතුළත් කාණ්ඩය,
(1) කන්නගි වලක්කුරයි කාවියම්, සරස්වති අන්දාදි සහ අභිරාමි අන්දාදි
(2) මලයිකාවියම්, දේවි බාගවදම් සහ මීනාට්චියම්මයි පිල්ලයිතමිල්
(3) සිලම්බු කුරල්, කෝවලන් කදයි සහ කන්නගි වලක්කුරයි කාවියම්
(4) කුලිර්තිප්පාඩල්, දේවිමගාත්මියම් සහ මාරියම්මන් තාලාට්ටු

36. ආගමම් හා සම්බන්ධ **නොවන** වන්දනාවට කියැවෙන සෙසු නම් ඇතුළත් කාණ්ඩය කුමක් ද?
(1) ඌර් දෙයිව වලිපාඩු, පත්තිනි වලිපාඩු සහ සූර්ය වලිපාඩු
(2) ග්‍රාමීය වලිපාඩු, නාට්ටාර් වලිපාඩු සහ සිරුදෙයිව වලිපාඩු
(3) කුලදෙයිව වලිපාඩු, නවග්‍රහ වලිපාඩු සහ එල්ලයිපුර වලිපාඩු
(4) මාලයි දෙයිව වලිපාඩු, අග්නි වලිපාඩු සහ වරුණ වලිපාඩු

37. ගොවිතැන් කටයුතුවල වෘත්තීය පිළිවෙත් හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) ඒර්මංගලම්, මූලයි සඩංගු සහ පොලිච්චඩංගු
(2) ආයුධ පූජාව, මඩයි පරවුදල් සහ නෝට්පුක්කට්ටල්
(3) වට්ට සඩංගුහල්, කෝයිට් සඩංගුහල් සහ කරගම් පාලිත්තල්
(4) දෙයිවමාඩල්, කුලිර්තිප්පාඩල් සහ ගිනි පෑගීම

38. පාසලේ ශිෂ්‍යයන් පිළිපැදිය යුතු ආගමික කටයුතු දැක්වෙන කාණ්ඩය කුමක් ද?
(1) ලිවීමේ දී 'පිල්ලයාර් සුළි' ඇඳීම, මල්මාල සෑදීම සහ නිශ්ශබ්දව සිටීම
(2) උදෑසන ආගමික වතාවත්වලට සහභාගි වීම, ශාරීරික අභ්‍යාසවල යෙදීම සහ සංස්කෘතික අංගවලට සහභාගි වීම
(3) උදෑසන ආගමික වතාවත්වලට සහභාගි වීම, දේව රූපවලට මල් ඉස පහන් පත්තු කිරීම සහ ගුරුවරුන්ට ආචාර කිරීම
(4) දෙවියන් වැඳීමෙන් පසුව තිරුනීරු ගා ගැනීම, උදෑසන ආගමික වතාවත්වලට සහභාගි වීම සහ ක්‍රීඩාවලට සහභාගි වීම



Department of Examinations, Sri Lanka

● පහත සඳහන් වගුවේ A සිට I දක්වා දී ඇති තොරතුරු ආශ්‍රයෙන් අංක **39** සහ **40** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| ශ්‍රී ලංකාවේ සිත්තර්වරුන් | විමුක්තිය ලැබූ නවසත්තිරම් | විමුක්තිය ලැබූ වර්ෂය |
|---|---|---|
| A – යෝගර් සුවාමිහල් | D – පංගුනි උත්තරම් | G – 1951 |
| B – නවනාදසිත්තර් | E – ආඩිසුවාදි | H – 1964 |
| C – සිත්තානයිකුට්ටි සුවාමිහල් | F – පංගුනි ආයිලියම් | I – 1902 |

**39.** ශිවතොන්ඩන් මධ්‍යස්ථානය හා සම්බන්ධ කාණ්ඩය,
(1) ADI (2) AFH (3) BEG (4) CDH

**40.** රජසැප පිළිකුල් යයි සිතා අධ්‍යාත්මික ජීවිතයට යොමු වී මඩකලපුවේ කාරයිතිවු හි දී විමුක්තිය ලැබූ අය හා සම්බන්ධ කාණ්ඩය,
(1) AFH (2) BDI (3) CEG (4) CFI

* *



Department of Examinations, Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

12 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2015 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2015 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2015

**ශෛවනෙරි I, II**
சைவநெறி I, II
Saivaneri I, II

## ශෛවනෙරි II

* **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20**ක් ද, දෙවන ප්‍රශ්නයට ලකුණු **16**ක් ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු **8** බැගින් ද හිමිවේ.

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
 (i) 'කඩවුල්' යන වචනයේ අර්ථය කුමක් ද?
 (ii) දෙවියන්ගේ ගුණාංග අටෙන් (එන්කුණම්) **දෙකක්** සඳහන් කරන්න.
 (iii) 'විප්‍රනායනාර්'යනුවෙන් හඳුන්වනු ලැබුයේ කවුරුන් ද?
 (iv) චෝල රජු කාලයේ තිරුකෝණේශ්වරම් හඳුන්වනු ලැබුයේ කුමන නමකින් ද?
 (v) ශ්‍රී ලංකාවේ පිහිටි තිරුප්පඩයි දේවාල **දෙකක්** නම් කරන්න.
 (vi) 'මාදෝට්ටම්' යනුවෙන් හඳුන්වනු ලබන දේවාලය කුමක් ද?
 (vii) පියවරුන් මිය ගිය අය විසින් කරනු ලබන උපවාසය කුමක් ද?
 (viii) තයිපූසම් දිනය විශේෂ දිනයක් ලෙස සලකා කරනු ලබන සුභ ක්‍රියා **දෙකක්** ලියන්න.
 (ix) "ඔරු පොරුලුම් කාට්ටා(ද්) ඉරුලුරුවං කාට්ටුම්
  ඉරු පොරුලුම් කාට්ටා(දු) ඉදු"
  මෙහි 'ඉදු' යනුවෙන් සඳහන් කෙරෙන්නේ කුමක් ද?
 (x) ශෛව ආගමේ විශේෂ ලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.

**2.** (i) පහත සඳහන් ගීතිකා **දෙකක්** නිවැරදිව හා නියම අනුපිළිවෙළට ලියන්න.
 (ii) ඒවායේ තේරුම ලියන්න.
  (අ) "ආලන් තානුගන් දමුදුසෙයි... "
  (ආ) "මාරිනින් රෙන්නයි... "
  (ඉ) "ආත්තාලයි යෙංග ළහිරාම... "
  (ඊ) "උලගෙ ලාමුණර්න් දෝද්වි..."
  (උ) "විනායගනේ වෙව්විනයයි... "

**3.** "ශ්‍රී ලංකා ඉතිහාසයේ පොළොන්නරු යුගයේ ශෛව ආගම උසස් ස්ථානයක තිබිණි."
 (i) චෝල රජ සමයේ පොළොන්නරුව හඳුන්වනු ලැබුයේ කුමන නමකින් ද?
 (ii) චෝල යුගයේ, නන්දි රුව සඳහන් වූ මුද්‍රාව සොයාගනු ලැබූ ශ්‍රී ලංකාවේ ශිව දේවාලයේ නම කුමක් ද? එම දේවාලය පිහිටා ඇත්තේ කොහේ ද?
 (iii) පොළොන්නරු යුගයේ සුවිශේෂත්වය ලැබ තිබූ ශිව දේවාල **දෙකක්** සම්බන්ධ ව කෙටියෙන් විස්තර කරන්න.

**4.** "ඥාන මාර්ගය වර්ධනය කළේ සන්ධාන කුරවර්ලා ය."
 (i) පුර සන්ධාන කුරවල්ලා **හතර දෙනකුගේ** නම් සඳහන් කරන්න.
 (ii) සිත්තාන්ද සාත්‍ර ග්‍රන්ථ කීයක් වේ ද? ඒවායින් අරුණන්දි සිවාචාරියර් රචනා කළ ග්‍රන්ථ **දෙක** මොනවා ද?
 (iii) සිත්තාන්ද ශාස්ත්‍ර ග්‍රන්ථවලින් විශිෂ්ටතම ග්‍රන්ථය වූ ශිවඥානපෝදම් පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.



Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka

**5.** "තිරුවාසගත්තිට්කු උරුගාදාර් ඔරු වාසගත්තිට්කුම් උරුගාර්."

(i) තිරුවාසගම්වල ගීතිකා කීයක් වේ ද? ඒවා රචනා කළේ කවුරුන් ද?

(ii) තිරුවාසගම් ලියන ලද පුස්කොළ පොත්වල අවසානයෙහි දෙවියන්ගේ අත්සන යොදා ඇත්තේ කෙසේ ද?

(iii) ශෛව ආගමිකයන් තම ජීවිතයෙහි දී තිරුවාසගම් ගායනා කරන විශේෂ අවස්ථා **තුනක්** සඳහන් කරන්න.

**6.** "එලිය නල් තීබම් ඉඩල් මලර් කොයිදල්
අලියින් මෙලුහල් අඳුතූර්තල් වාල්ත්තල්
පලිපණි පට්‍රල් පන්මංජනම් ආදි
තලි තොලිල් සෙයිවඳු තාන් තාස මාර්ක්කමේ" - තිරුමන්දිරම්

(i) සරියෛ පිළිපදින්නන් ලබන මාර්ගය හා විමුක්තිය සඳහන් කරන්න.

(ii) සරියෛ මාර්ගය පිළිපදින ලද නායන්මාර්වරුන් **තිදෙනකු** නම් කරන්න.

(iii) ශාරීරික සේවා (සරියෛ තොණ්ඩුහල්) පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරා ගෙන, කෙටි සටහන් ලියන්න.

(i) සුන්දර්මූර්ති නායනාර්තුමාගේ සමාජ සේවා

(ii) අප්‍රේල් අවුරුදු උදාව (සිත්තිරෛ වරුඩපිරප්පු)

(iii) ශෛව විද්‍යා විරුත්ති සංගම්

(iv) ශෛව ආගමික ජීවිතයේ මිනිස්කම

(v) මාමාංග පිල්ලෛයාර් දේවාලය

* * *

Department of Examinations, Sri Lanka
Department of Examinations, Sri Lanka